තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## කේ.ජේ.ටී.ජී. අනුර එ. සී/ස ගාලු ගඟබඩ පත්තුව දකුණ කුඩා තේ වතු හිමියන්ගේ සමූපකාර සමිතිය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 632/2018 (2019.07.22) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - කේ.ජේ.ටී.ජී. අනුර
**නොතිසි ලත් පාර්ශවය**- නම් කළ නිලධාරී, සී/ස ගාලු ගඟබඩ පත්තුව දකුණ කුඩා තේ වතු හිමියන්ගේ සමූපකාර සමිතිය

**පෙනීසිටීම**

අභියාචක - කේ.ජේ.ටී.ජී. අනුර
පොදු අධිකාරිය - එම්.කේ. ගුණතිලක -සභාපති

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.05.11 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.03 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.08.15 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

අභියාචක විසින් 2018.05.11 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.
තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.07.03 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.08.15 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

2019.07.22 පාර්ශව දෙකම පැමිණ සිටිති. සුළු තේවතු හිමියන්ගේ සමුපාකර සමිතියකි.එය තොරතුරු පනත යටතට නොගැනෙන බව මුලදී ඉදිරිපත් කැරිණ. එහෙත් එය සමුපකාර සමිතියක් ලෙස එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. ආණ්ඩුවේ පාලනයක් හෝ වියදමක් නොදැරුවත් එය පනත අනුව තොරතුරු දීමට බැදීමක් ඇත. එහෙයින් දෙසතියක් ඇතුළත අදාළ තොරතුරු අභියාචකට ලබා දීමට නියෝග කරනු ලැබේ..

## නියෝගය:

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දීමට එකඟ වූ බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.